# 17 වන කාණ්ඩය

❖ 17 වන කාණ්ඩයේ නැඹුරුතා

❖ 17වන කාණ්ඩයේ සරල සංයෝග

- ➢ හයිඩ්‍රජන් හේලයිඩ්
- ➢ සිල්වර් හේලයිඩ

❖ ක්ලෝරීන් වල ඔක්සයිඩ සහ ඔක්සො අම්ල

❖ හේලයිඩ

❖ ක්ලෝරීන්වල ප්‍රතික්‍රියා

- ➢ ප්‍රබල ඔක්සිකාරකයක් ලෙස
- ➢ ක්ලෝරීන්වල ද්විධාකරණ ප්‍රතික්‍රියා

❖ ඔක්සො ඇනායනවල ප්‍රතික්‍රියා

- ➢ හයිපොක්ලෝරයිඩ් වල ද්විධාකරණ ප්‍රතික්‍රියා

## ❖ 17 වන කාණ්ඩයේ නැඹුරුතා

* හැලජන ප්‍රතික්‍රියාශීලි වන අතර ස්වභාවයේ සංයෝග ලෙස පමණක් හමු වේ.
* වඩාත් ම විද්‍යුත් සෘණ මූලද්‍රව්‍යය ෆ්ලෝරීන් වන අතර, -1 හා 0 ඔක්සිකරණ අවස්ථා පෙන්නුම් කරයි.
* ෆ්ලෝරීන් හැර අනෙක් හැලජන -1 සිට +7 දක්වා පැවතිය හැකි සැම ඔක්සිකරණ අවස්ථාවට ම පාහේ අනුරූප වන ස්ථායි සංයෝග සාදයි.
* කෙසේ වෙතත් බ්‍රෝමීන්වල +7 ඔක්සිකරණ අවස්ථාවේ පවතින සංයෝග අස්ථායි වේ.
* කුඩා පරමාණුක අරය හේතුවෙන්, අනෙක් මූලද්‍රව්‍යවල ඉහළ ඔක්සිකරණ අවස්ථා ස්ථායි කිරීම ෆ්ලෝරීන්වලට හැකි ය,
* හැලජනවල ඔක්සිකරණ හැකියාව කාණ්ඩයේ පහළටයත් ම අඩු වේ.
* ෆ්ලෝරීන් ප්‍රබල ඔක්සිකාරයක් වේ.
* හැලජනවල ප්‍රතික්‍රියාශීලිත්වය කාණ්ඩය ඔස්සේ පහළට යත් ම අඩු වේ,
* මෙය හැලජනවල ප්‍රතිස්ථාපන ප්‍රතික්‍රියා ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය,

$$Cl_2(aq) + 2Br^-(aq) \rightarrow 2Cl^-(aq) + Br_2(aq)$$

$$Br_2(aq) + 2I^-(aq) \rightarrow 2Br^-(aq) + I_2(aq)$$

* F පරමාණුවල බන්ධන නොසැදූ ඉලෙක්ට්‍රෝන යුගල වල විකර්ෂණ හේතුවෙන් වල බන්ධන ශක්තිය (155 $kJ\ mol^{-1}$) $Cl_2$ වල ඒ අගයට (240 $kJ\ mol^{-1}$) වඩා අඩු ය, ෆ්ලෝරීන් වායුවේ අධික ප්‍රතික්‍රියාශීලිත්වයට හේතුව මෙයයි.

* 17 වන කාණ්ඩය ඔස්සේ පහළට බන්ධන ශක්ති ක්‍රමානුකූල අඩු වීමක් පෙන්නුම් කරයි.

($Cl_2$ = 240 $kJ\ mol^{-1}$, $Br_2$ = 190 $kJ\ mol^{-1}$ $I_2$ = 149 $kJ\ mol^{-1}$).

## 17වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ගුණ

| | F | Cl | Br | I | **At |
|---|---|---|---|---|---|
| භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රොනික වින්‍යාසය | $[He]2s^2 2p^5$ | $[Ne]3s^2 3p^5$ | $[Ar]3d^{10}4s^2 4p^5$ | $[Kr]4d^{10}5s^2 5p^5$ | $[Xe]4f^{14}5d^{10}6s^2 6p^5$ |
| වැන්ඩර් වාල්ස් අරය/ pm | 135 | 180 | 195 | 215 | - |
| අයනික අරය/ pm | 133 | 181 | 196 | 220 | - |
| සහසංයුජ අරය/pm | 71 | 99 | 114 | 133 | - |
| ද්‍රවාංකය/ °C | -220 | -101 | -7.2 | 114 | - |
| තාපාංකය/ °C - | 188 | -34.7 | 55.8 | 184 | - |
| පෝලිං විද්‍යුත් ඍණතාව | 4.0 | 3.2 | 3.0 | 2.7 | - |
| ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ එන්තැල්පිය/ kJ $mol^{-1}$ $X(g) + e \rightarrow X^-(g)$ | -328 | -349 | -325 | -295 | - |

** අ.පො.ස (උ.පෙළ) රසායන විද්‍යා විෂය නිර්දේශයට අයත් නොවේ.

### ❖ 17වන කාණ්ඩයේ සරල සංයෝග

#### ➢ *හයිඩ්‍රජන් හේලයිඩ්*

- ජලයේ දී හයිඩ්‍රජන් හේලයිඩ් ආම්ලික වේ.
- ප්‍රබල හයිඩ්‍රජන් බන්ධන සෑදීමේ හැකියාව HF සතු වන නමුත් වායුගෝලීය පීඩනයේ දී හා උෂ්ණත්වයේ දී HF වායුවක් (තාපාංකය 20 °C) වේ.

**ජලීය ද්‍රාවණවල දී හයිඩ්‍රජන් හේලයිඩවල ආම්ලික ස්වභාවය**

සඳහා HF;

$$HF(g) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + F^-(aq)$$

අනෙක් හයිඩ්‍රජන් හේලයිඩ සඳහා (HCl, HBr හා HI);

$$HX(g) + H_2O(l) \rightarrow H_3O^+(aq) + X^-(aq)$$

- ජලීය මාධ්‍යයේ දී **HF දුබල අම්ලයක්** වන අතර, **අනෙකුත් හයිඩ්‍රජන් හේලයිඩ ප්‍රබල** අම්ල වේ.
- HF වලට ඉහළ බන්ධන ශක්තියක් ඇති අතර (ප්‍රබල සහසංයුජ බන්ධන), එයට ජලයේ දී විඝටනය වී $H^+$ අයන ලබා දීමට අපහසු වේ.
- 17කාණ්ඩය දිගේ පහළට යන විට **හයිඩ්‍රජන් හේලයිඩවල ආම්ලික ප්‍රබලතාව වැඩි** වේ.
- ඉහත සඳහන් කළ කරුණු ආශ්‍රයෙන් එය පැහැදිලි කළ හැකි ය.

17කාණ්ඩය ට අයත් හයිඩ්‍රජන් හේලයිඩවල තෝරා ගත් ගුණ කිහිපයක් පහත වගුවේ දැක්වේ.

*<u>17 කාණ්ඩයට අයත් හයිඩ්‍රජන් **හේලයිඩවල තෝරා ගත් ගුණ**</u>*

| | HF | HCl | HBr | HI |
|---|---|---|---|---|
| ද්‍රවාංකය/ °C | -84 | -114 | -89 | -51 |
| තාපාංකය/ °C | 20 | -85 | -67 | -35 |
| බන්ධන දිග/ pm | 92 | 127 | 141 | 161 |
| බන්ධන විඝටන ශක්තිය/ kJ mol-1 | 570 | 432 | 366 | 298 |

## ➢ *සිල්වර් හේලයිඩ*

* **හේලයිඩ** (ක්ලෝරයිඩ, බ්‍රෝමයිඩ සහ අයඩයිඩ) **හඳුනා ගැනීම** සඳහා සිල්වර් හේලයිඩ භාවිත කළ හැකි ය. එහි දී සෑදෙන අවක්ෂේපයේ වර්ණය සැලකිල්ලට ගනු ලැබේ.

4.14 වගුව 17 කාණ්ඩයට අයත් සිල්වර් හේලයිඩ

| | <u>සිල්වර් හේලයිඩ වර්ණය</u> | <u>ඇමෝනියාවල ද්‍රාව්‍යතාව</u> |
|---|---|---|
| AgCl | සුදු ... | **තනුක** ජලීය අමෝනියාවල **දිය වේ.** |
| AgBr | ළා කහ.. | **සාන්ද්‍ර** ජලීය අමෝනියාවල **දිය වේ.** |
| AgI | කහ.. . | තනුක ජලීය ඇමෝනියා සහ සාන්ද්‍ර ජලීය ඇමෝනියාවල **දිය නොවේ.** |

https://www.youtube.com/watch?v=-stxjLoy8Jo Halogen with Ag+ Reactions

https://www.youtube.com/watch?v=WU5KHBMXcNQ golden rain

## ❖ ක්ලෝරින් වල ඔක්සයිඩ සහ ඔක්සො අම්ල

* ක්ලෝරින් විසින් **විවිධ ඔක්සිකරණ අංක** ඇති ඔක්සයිඩ සහ ඔක්සො ඇනායන කිහිපයක් සාදනු ලබයි.
* ඔක්සො ඇනායන කිහිපයක් **ප්‍රබල ඔක්සිහාරක** වේ.

තෝරා ගත් ක්ලෝරින්වල ඔක්සයිඩ වගුව පහත දක්වේ.

***ක්ලෝරින්වල තෝරා ගත් ඔක්සයිඩ සහ ඔක්සෝ ඇනායන***

| ඔක්සිකරණ අවස්ථා | ඔක්සයිඩවල සූත්‍රය | ඔක්සෝ ඇනායන සූත්‍රය | ඔක්සෝ ඇනායන ව්‍යුහය |
|---|---|---|---|
| +1 | $Cl_2O$ | $ClO^-$ |  |
| +3 | | $ClO_2^-$ |  |
| +5 | | $ClO_3^-$ |  |
| +6 | $ClO_3$ සහ $Cl_2O_6$ | | |
| +7 | $Cl_2O_7$ | $ClO_4^-$ |  |




- * ක්ලෝරින් ඔක්සො අම්ල වර්ග හතරක් සාදයි.
- * ක්ලෝරින් පරමාණුවේ **ඔක්සිකරණ අංකය වැඩි වීමත් සමඟ ආම්ලික ප්‍රබලතාව** වැඩි වේ.

ඔක්සො අම්ලවල ව්‍යුහය සහ ඔක්සිකරණ අංකය පහත වගුව මගින් දෙනු ලැබේ.

**<u>ක්ලෝරින් ඔක්සො අම්ලවල ව්‍යුහය</u>**

| | HOCl | $HClO_2$ | $HClO_3$ | $HClO_4$ |
|---|---|---|---|---|
| ඔක්සිකරණ තත්ත්වය | +1 | +3 | +5 | +7 |
| ව්‍යුහය |  |  |  |  |

ඔක්සො අම්ලවල ක්ලෝරින්හි **ඔක්සිකාරක බලය** පහත ආකාරයට වෙනස් වේ.

- * **HOCl > $HClO_2$ > $HClO_3$ > $HClO_4$**
- * HOCl, $HClO_2$, $HClO_3$, $HClO_4$ වල ඇති ක්ලෝරින්වල ඔක්සිකරණ අංකය පිළිවෙළින් +1, +3, +5 සහ +7වේ
- * **ඔක්සිකරණ අංකය වැඩි අම්ලය ප්‍රබල අම්ලය වේ**
- * ඒ නිසා ආම්ලික ප්‍රබලතාව **HOCl < $HClO_2$ < $HClO_3$ < $HClO_4$** ලෙස විචලනය වේ

## ❖ හේලයිඩ

- * බොහෝ සහසංයුජ **හේලයිඩ ජලය සමඟ වේගයෙන් ප්‍රතික්‍රියා** කරයි.
- * $CCl_4$ ජල විච්ඡේදනයට භාජනය නො වේ.
- * බොහෝ ෆ්ලෝරයිඩ සහ සමහර හේලයිඩ නිෂ්ක්‍රිය වේ.
- * **14කාණ්ඩය සහ 15කාණ්ඩය ට අයත් මූලද්‍රව්‍යවල ක්ලෝරයිඩ *ජලය අඩු ප්‍රමාණයක් සමඟ*** පහත ආකාරයෙන් ප්‍රතික්‍රියා කරයි

$SiCl_4(l) + 2H_2O(l) \rightarrow 4HCl(aq) + SiO_2(s)$

$PCl_5(s) + H_2O(l) \rightarrow POCl_3(aq) + 2HCl(aq)$

- **14කාණ්ඩය සහ 15කාණ්ඩය ට අයත් මූලද්‍රව්‍යවල ක්ලෝරයිඩ *වැඩිපුර ජලය සමඟ*** පහත ආකාරයෙන් ප්‍රතික්‍රියා කරයි.

$SiCl_4 (l) + 3H_2O(l) \rightarrow 4HCl(aq) + H_2SiO_3(aq)$

$NCl_3(l) + 4H_2O(l) \rightarrow NH_4OH(aq) + 3HOCl(aq)$

$PCl_3(l) + 3H_2O(l) \rightarrow H_3PO_3(aq) + 3HCl(aq)$

$PCl_5(s) + 4H_2O(l) \rightarrow H_3PO_4(aq) + 5HCl(aq)$

$AsCl_3(s) + 3H_2O(l) \leftrightharpoons H_3AsO_3(aq) + 3HCl(aq)$

$SbCl_3(aq) + H_2O(l) \leftrightharpoons SbOCl(s) + 2HCl(aq)$

$BiCl_3(aq) + H_2O(l) \leftrightharpoons BiOCl(s) + 2HCl(aq)$

## ❖ ක්ලෝරින්වල ප්‍රතික්‍රියා

### ➤ *ප්‍රබල ඔක්සිකාරකයක් ලෙස*

- ක්ලෝරින්, ෆ්ලෝරින් වලට වඩා **අඩු ප්‍රතික්‍රියාශීලි** වේ.
- එහෙත් ක්ලෝරින් වායුව **ප්‍රබල ඔක්සිකාරකයක්** ලෙස හැසිරෙයි

ක්ලෝරින් වායුව ප්‍රබල ඔක්සිකාරකයක් ලෙස හැසිරෙන ප්‍රතික්‍රියා කිහිපයක් පහත දැක්වේ.

$2Cu(s) + Cl_2(g) \rightarrow 2CuCl(s)$

$2CuCl(s) + Cl_2(g) \rightarrow 2CuCl_2(s)$

$Fe(s) + Cl_2(g) \rightarrow FeCl_2(s)$

$2FeCl_2(s) + Cl_2(g) \rightarrow 2FeCl_3(s)$

https://www.youtube.com/watch?v=LOldFUwr1wc Cl2+Cu

https://www.youtube.com/watch?v=edLpxdERQZc Cl2+Cu

https://www.youtube.com/watch?v=ygLDJKG_QSY Cl2+Fe

https://www.youtube.com/watch?v=oZdQJi-UwYs Cl2+Na

වැඩිපුර ඇමෝනියා, $8NH_3(g) + 3Cl_2(g) \rightarrow N_2(g) + 6NH_4Cl(g)$

වැඩිපුර ක්ලෝරින්, $3Cl_2(g) + NH_3(g) \rightarrow 3HCl(g) + NCl_3(l)$

### ➤ *ක්ලෝරින්වල ද්විධාකරණ ප්‍රතික්‍රියා*

- ක්ලෝරින් ජලය සහ භස්ම සමඟ ප්‍රතික්‍රියා කර ඔක්සිහරණය සහ ඔක්සිකරණය එකිනෙකට සමගාමීව සිදු කරයිග ක්ලෝරින් සමඟ ජලය ප්‍රතික්‍රියාවට

$Cl_2(g) + H_2O(l) \rightarrow HOCl(aq) + HCl(aq)$

* මේ ප්‍රතික්‍රියාවේ දී ක්ලෝරින් ($Cl_2$) ඔක්සිකරණය තත්ත්වය ශුන්‍යයේ සිට +1 (HOCl) ඔක්සිකරණය වන අතර, -1 ($Cl^-$) දක්වා ඔක්සිහරණය වේ.
* සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් සමග ප්‍රතික්‍රියාව; සිසිල් තනුක සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් සමග

$Cl_2(g)$ + **සිසිල් තනුක** $2NaOH(aq) \rightarrow NaCl(aq) +$ **NaOCl**$(aq) + H_2O(l)$

* උණු සාන්ද්‍ර/ උණු තනුක සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ

$3Cl_2(g)$ + **සාන්ද්‍ර** $6NaOH(aq) \rightarrow 5NaCl(aq) +$ **$NaClO_3$**$(aq) + 3H_2O(l)$ ( 80 °C ඉහළ)

https://www.youtube.com/watch?v=FDIx_TyPeeU . Reactions of chlorine

### ❖ *ඔක්සො ඇනායනවල ප්‍රතික්‍රියා*

* අඩු උෂ්ණත්වයේ දී $ClO^-$ ස්ථායි වන අතර, **ඉහළ උෂ්ණත්වයේ දී ද්විධාකරණය** වී $Cl^-$ සහ $ClO_3^-$ අයන සාදයි.
* කෙසේ වෙතත් $BrO^-$ සහ $IO^-$ යන දෙක ම **අඩු උෂ්ණත්වයේ දී පවා ස්ථායි නොවන** අතර ද්විධාකරණයට භාජනය වේ.

#### ➢ *හයිපොක්ලෝරයිඩ් වල ද්විධාකරණ ප්‍රතික්‍රියා*

* හයිපොක්ලෝරයිට් ද්විධාකරණය වී ක්ලෝරේට් සහ ක්ලෝරයිට් සෑදීම පහත ආකාරයට ලිවිය හැකි ය.

$3ClO^- \leftrightharpoons ClO_3^- + 2Cl^-$

* ආම්ලික තත්ත්ව යටතේ, HOCl ට වඩා $ClO^-$ ස්ථායි වේ. ඒ නිසා භාස්මික තත්ත්ව යටතේ ද්විධාකරණ ප්‍රතික්‍රියා මූලික වේ.

https://www.youtube.com/watch?v=rBhMWpyO7Ts test for X-

https://www.youtube.com/watch?v=u2ogMUDBaf4 test for X-

https://www.youtube.com/watch?v=wj5FNNPNWtg test for X-

https://www.youtube.com/watch?v=1JDTAelU6gQ KBr+ Cl2

https://www.youtube.com/watch?v=mpl0Ofp7inw KI +Cl2

## 18 වන කාණ්ඩයට අයත් මූලද්‍රව්‍ය

### 18 වන කාණ්ඩයේ ප්‍රවණතා

* 18 කාණ්ඩයට අයත් **මූලද්‍රව්‍ය සියල්ල ප්‍රතික්‍රියාශීලි නැති ඒක පරමාණුක වායු** වේ.
* **Xe පමණක් සැලකිය යුතු සංයෝග ප්‍රමාණයක් සාදයි.**
* 18 කාණ්ඩයට අයත් සියලු මූලද්‍රව්‍යවලට ධන ඉලෙක්ට්‍රොන ලබා ගැනීමේ එන්තැල්පියක් ($+\Delta H_{eg}$) ඇත.
* එයට හේතුව ලබා ගන්නා ඉලෙක්ට්‍රෝනය **අලුත් ශක්ති මට්ටමට** අයත් වීම යි.

**<u>18 අයත් මූලද්‍රව්‍යවල ගුණ</u>**

| | He | Ne | Ar | Kr | Xe |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රොන වින්‍යාසය | 1s2 | [He]2s22p6 | [Ne]3s23p6 | [Ar]3d104s24p6 | [Xe]4d105s25p6 |
| පරමාණුක අරය/ pm | 99 | 160 | 192 | 197 | 240 |
| 1 වන අයනීකරණ ශක්තිය/ kJ mol$^{-1}$ | 2373 | 2080 | 1520 | 1350 | 1170 |
| ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ එන්තැල්පිය/ kJ mol$^{-1}$ | 48.2 | 115.8 | 96.5 | 96.5 | 77.2 |

- **18 වන කාණ්ඩයට අයත් මූලද්‍රව්‍යවල සරල සංයෝග**

* සෙනෝන්වල සංයෝගවලට +2, +4, +6 සහ +8. ඔක්සිකරණ අංක ඇත.
* සෙනෝන් කෙළින් ම **ප්ලෝරීන් සමඟ ප්‍රතික්‍රියා** කරයි.

සමහර Xe සංයෝග පහත වගුව මගින් පෙන්වනු ලැබේ.

**Xe වල තෝරා ගත් සංයෝග කිහිපයක්**

| ඔක්සිකරණ අංකය | සංයෝගය | ව්‍යුහය |
|---|---|---|
| +2 | $XeF_2$ |  Linear |
| +4 | $XeF_4$ |  |
| +6 | $XeF_6$ |  |
| +6 | $XeO_3$ |  Trigonal Pyramidal |
| +8 | $XeO_4$ |  |



He



Ne



Ar



Kr



Xe